ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පීටීවී) එල්ටීඩී (TPTL)- 2022

---------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පීටීවී) එල්ටීඩී (TPTL) ("සමාගම")2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ /අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් **36,813,294** ක පාඩුවක් විය. සමාගම **2021** දෙසැම්බර් **24** දින පිහිටුවන ලද අතර සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු ආදායමක් සහ විකුණුම් පිරිවැයක් නොතිබුණි. අලාභයට ප්‍රධාන හේතුව **2022** වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයට කල් බදු පොලී ගෙවීමට අදාළ මූල්‍ය වියදම් ය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතාව

2022 ජනවාරි 06 වැනි දින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), Lanka IOC PLC (LIOC) සහ මෙම සමාගම විසින් වසර පනහක (50) වලංගු කාලයක් සඳහා චීන වරාය තෙල් ටැංකි සංකීර්ණය සන්තකයේ තබා ගැනීම, සංවර්ධනය කිරීම සහ භාවිතය සඳහා අත්සන් කරන ලද ගිවිසුමට අනුව, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හෝ වෙනත් නිෂ්පාදන ගබඩා කිරීම, ගබඩා කර ඇති නිෂ්පාදන අපනයනය කිරීම වැනි CPC සහ LIOC අතර වඩාත් සම්පූර්ණයෙන් එකඟ වූ ව්‍යාපාර කරගෙන යාමට මෙම සමාගමට පූර්ණ සහ අසීමිත නිදහස ඇත.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) චීන වරාය තෙල් ටැංකි සංකීර්ණය, ව්‍යාපාර කරගෙන යාමට සුදුසු පරිදි සංවර්ධනය කිරීම සඳහා නිසි උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(ආ)සමාගම සංස්ථාගත කර මාස 20 කට වැඩි කාලයක් ගත වී ඇතත්, එකී ව්‍යාපාර පිළිබඳ නිසි මූල්‍ය සහ වෙනත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඇගයීමට ලක් කර නොතිබුණි.<br><br>(ඇ) දිගුකාලීන සංයුක්ත සැලැස්මක් හා ව්‍යාපාර ආකෘතියක් සකස් කර නොමැත. | "10,000 m3 ධාරිතාවයකින් යුත් වානේ ගබඩා ටැංකි 61 සහ ඒ ආශ්‍රිත ප්‍රදේශය සහ ඉහළ ටැංකි සංකීර්ණයේ ඒ ආශ්‍රිත පහසුකම් සංවර්ධනය සඳහා සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය'' තෝරාගත් උපදේශක ඉන්දියාවේ ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් සිදු කරනු ලබන අතර දැනට 75% (ආසන්න වශයෙන්) වැඩ නිම කර ඇත. මෙම උපදේශන කොන්ත්‍රාත්තුවේ අවසන් වාර්තාව 2023 මැයි මස අවසානයේදී ලැබීමට නියමිතය. ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ ප්‍රතිඵල මත පදනම්ව, උපායමාර්ගික සැලැස්ම, දිගුකාලීන සැලැස්ම, ආයතනික සැලැස්ම, ව්‍යාපාර ආකෘතිය සහ සංවිධාන ව්‍යුහය TPTL විසින් සකස් කල කළ යුතුය.<br><br>සමාගමේ මූලික මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ LIOC හි සේවකයින් තාවකාලික පදනමින් අනුයුක්ත කරමින් සංවිධාන ව්‍යුහයක් සකස් කර ඇත. | ශක්‍යතා අධ්‍යයනය අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. උපායමාර්ගික සැලැස්ම, ව්‍යාපාර ආකෘතිය, ආයතනික සැලැස්ම සහ සංවිධාන ව්‍යුහය ආදිය සකස් කර ක්‍රියාත්මක කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| **(ඇ) ජැටි, නල මාර්ග සහ අනෙකුත් අනුබද්ධ සේවා භාවිතය ඇතුළු පොදු පරිශීලක පහසුකම් භාවිතා කිරීම සඳහා වන ගිවිසුමක් CPC, LIOC යනාදී අනෙකුත් සම්බන්ධිත පාර්ශ්ව සමඟ තවමත් එළැඹී නොතිබුණි.** | **අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නියමිත තෝරාගත් උපදේශකයා සමඟ සාකච්ඡා කර පොදු පරිශීලක පහසුකම් භාවිතය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ LIOC සමඟ ගිවිසුමකට එළඹීමට නියමිතය.** | **මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර නිසි පොදු පරිශීලක පහසුකම් ගිවිසුමකට එළඹීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.** |